ඇමුණුම II

| I | II |
|---|---|
| **වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු තැනැත්තන්** | **වත්කම් බැරකම් ප්‍රකාශ භාරගතයුතු තැනැත්තන්** |
| (අ) ජනාධිපතිවරයා | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| (ආ) අග්‍රාමාත්‍යවරයා, කැබිනට් අමාත්‍යවරු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරු | ජනාධිපතිවරයා |
| (ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | කතානායකවරයා |
| (ඈ) පළාත් ආණ්ඩුකාරවරු | ජනාධිපතිවරයා |
| (ඉ) පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධරයන් | ආණ්ඩුකාරවරයා (පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ)<br><br>ප්‍රධාන ලේකම් (මාණ්ඩලික නිලධරයන්ගේ)<br><br>පළාත් සභා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ඊ) පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගනු ලැබූ සභිකයන් සහ මාණ්ඩලික නිලධරයන් | • පලාත් පාලන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා (පළාත් පාලන ආයතන වල සාමාජිකයන්)<br>• පලාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් (නාගරික කොමසාරිස්, පළාත් පාලන ආයතන ලේකම්)<br>• නාගරික කොමසාරිස් (නගර සභා සාමාජිකයන්ගේ, මාණ්ඩලික නිලධරයන්ගේ)<br>• නගර සභා ලේකම් (නගර සභා මාණ්ඩලික නිලධරයන්)<br>• ප්‍රාදේශීය සභා ලේකම් (ප්‍රාදේශීය සභා මාණ්ඩලික නිලධරයන්) |
| (උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විනිසුරුවරුන් සහ රජයේ නිලධරයන් | ජනාධිපතිවරයා |

| | |
|---|---|
| (ඍ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රජයේ නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (එ) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධරයන් සහ ලේඛනගත රජයේ නිලධරයන් | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් |
| (ඒ) අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (ඔ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලබන ලද ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් | ජනාධිපතිවරයා |
| (ඕ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවල අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරුන් හෝ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන් | ජනාධිපතිවරයා |
| (ක) ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රාජ්‍ය බැංකුවල මාණ්ඩලික නිලධරයන් | මහ බැංකු අධිපති (මහ බැංකුවේ මාණ්ඩලික නිලධරයන්ගේ)<br><br>අදාළ සාමාන්‍යාධිකාරී (බැංකු මාණ්ඩලික නිලධරයන්ගේ) |
| (ග) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඇ) ව්‍යවස්ථාව යටතේ හෝ යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවල මාණ්ඩලික නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (ච) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද ස්වාධීන නියාමන සහ අධීක්ෂණ කොමිෂන් සභාවල හෝ පුද්ගල මණ්ඩලවල සභාපතිවරු, කොමසාරිස්වරු, සාමාජිකයන් සහ මාණ්ඩලික නිලධරයන් | පත්කිරීම් බලධාරියා / ආයතන ප්‍රධානියා |

| | |
|---|---|
| (ජ) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවක සභාපතිවරු, අධ්‍යක්ෂවරු, මණ්ඩලවල සාමාජිකයන්, විධායක නිලධරයන් | පත්කිරීම් බලධාරියා |
| (ට) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන් | පත්කිරීම් බලධාරියා |
| (ඩ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධරයන් | යුද්ධ හමුදාපතිවරයා |
| (ණ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයන් | නාවික හමුදාපතිවරයා |
| (ත) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලලත් නිලධරයන් | ගුවන් හමුදාපතිවරයා |
| (ද) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 2 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත හෝ (138 වන අධිකාරය වූ) වෘත්තිය සමිති ආඥා පනතේ කාර්ය සඳහා වන පිළිගත් දේශපාලන පක්ෂවල තනතුරු දරන්නන් | මැතිවරණ කොමසාරිස් |

| | |
|---|---|
| (න) (138 වන අධිකාරිය වූ) වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිතිවල විධායක නිලධරයන් | කම්කරු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ප) 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමකදී තෝරා පත්කර ගැනීම සඳහා නම් කළ අපේක්ෂකයන් | මැතිවරණ කොමසාරිස් |
| (බ) රජය හෝ රජයේ සංස්ථාවක් විසින් සියයට විසිපහකට නොඅඩු කොටස් දරන්නා වූ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදංචි කළ සමාගම්වල සභාපතිවරුන්, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයන් | සමාගම් රෙජිස්ට්‍රාර් |
| (ම) මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන වන්නා වූ මූල්‍ය ආයතනවල කලමනාකරණ හෝ අධීක්ෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලය | අදාළ ආයතන ප්‍රධානියා |
| (ය) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ධූත මණ්ඩලවල ප්‍රධානීන් | ජනාධිපතිවරයා |
| (අ) අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ධූත මණ්ඩලවලට පත්කළ නිලධරයන් | විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් |
| (ආආ) (180 වන අධිකාරය වූ) ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබ ඇති පුවත්පත්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන් | ජනමාධ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ලේකම් |
| (ඇඇ)1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී මාධ්‍ය සමාගම්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන් | විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම් |

| | |
|---|---|
| (ඇඇ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සම්ගම්වල ධූර දරන නිලධරයන් | ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ඉඉ) යම් නිලධරයන් ඔවුන්ට අදාළ යම් නිලයන්වල කටයුතු කිරීමේදී එම වැඩකටයුතුවල ස්වභාවයන් සැලකිල්ලට ගත්විට අල්ලස් හෝ දූෂණවලට පෙළඹීමට ඒ නිලධරයාට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් අධිඅවදානම් කාණ්ඩ ලෙස නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් වෙනත් නිලධාරී කාණ්ඩයන් | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට |

* යම් වෙනත් නීතියක් මගින් විශේෂිත විධි විධාන සලසා ඇති විට එකී විධිවිධාන වලට අනුකූලව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම සිදු කළ යුතු ය.